නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වැසිකිලියට පිවිසුනු විට, ‘අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් කුබුසි වල්කබාඉසි’ - අහෝ අල්ලාහ්! පුරුෂ හා ස්ත්රී ෂෙයිතානුන්ගෙන් ආරක්ෂාව මම ඔබෙන් පතමි.- යනුවෙන් ප්රාර්ථනා කරන්නෙකු වූහ

අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වැසිකිලියට පිවිසුනු විට, ‘අල්ලාහුම්ම ඉන්නී අඌදු බික
මිනල් කුබුසි වල්කබාඉසි’ - අහෝ අල්ලාහ්! පුරුෂ හා ස්ත්රී ෂෙයිතානුන්ගෙන් ආරක්ෂාව
මම ඔබෙන් පතමි.- යනුවෙන් ප්රාර්ථනා කරන්නෙකු වූහ. [صحيح] [متفق عليه]

සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තම ශාරීරික අවශ්යතා ඉටු කරන ස්ථානයට පිවිසුනු විට, එහි මළ පහ කිරීමට හෝ මූත්රා කිරීමට සිතුව ද එතුමාණෝ අල්ලාහ්ගෙන් ආරක්ෂාව පැතූහ. ස්ත්රී හා පුරුෂ ෂෙයිතානුන්ගෙන් ආරක්ෂාව ඔහුගෙන් පතා ඔහු වෙත නැඹූරු වූහ. අල්- (හු)කුබුසු නම් පදය නපුර ලෙසත් (හ)කබාඉස් යන පදය අපවිත්ර දෑ ලෙසත් විස්තර කෙරී ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/3150